සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය - 2

විෂය - බුද්ධ ධර්මය

ශ්‍රේණිය - 3

2021 ඔක්තෝබර් මාසය

සැකසුම : රේණුකා කුමාරි මිය - බලන්ගොඩ අධ්‍යාපන කලාපය

## 22.පාඩම - මල් දන්සල

පුතාලා මල් පැළයක් හිටෙව්වාද? එහෙමනම් ගොඩක් හොඳයි පුතේ...මොනවගෙ මල්ද හිටෙව්වේ. පිච්ච, වතුසුද්ද නම් ඉතාම හොදයි නේද?

- දුවේ පුතේ අරලිය ළමා සමාජයේ දරුවෝ මල් දන්සලට ගත්තේ මොන මල්ද?
- මට කියන්න බලන්න ,එයාලා දන්සල දුන්නේ මොන පෝය දවසෙද කියලා.
- එයාලා මල් දුන්නේ ගොටු ගහලා.ඔයාලා දන්නවද ඒ ගොටු ගැහුවෙ මොන කොළ වලින්ද කියලා.

  එහෙමනම් කොළයේ හැඩය අදින්න බලන්න.
- ඔයාලට පුළුවන් අරලිය ළමා සමාජයේ යාළුවො මල් දන්සල දුන්න විදිහ අදින්න.
- ඔන්න දුවේ පුතේ කැන්ද කොළයක් හරි ඒ වගේ වෙන ලොකු කොළයක් හොයාගෙන අපි බලමු ගොටු ගහන්න පුළුවන්ද කියලා.පුතාලගෙ වැඩිහිටියන්ගෙන් අහන්නත් පුළුවන්.

  එහෙමනම් අපි වැඩි වැඩියෙන් මල් පැළ හිටවමු.ඒවා රැක බලා ගනිමු.ඊට පස්සෙ අපිට පුළුවන් ලබන පෝයට මල් දන්සල දෙනකොට මල් නෙලාගන්න.

මල් දන්සල - බුද්ධ ධර්මය විෂය යටතේ මෙම පාඩමට අදාළ වීඩියෝ නැරඹීම සඳහා youtube එකට ගොස් Renuka kumari -මල් දන්සල 2 ලෙස search කරන්න.